(නවවැනි පාර්ලිමේන්තුව -  පස්වැනි සභාවාරය)

අංක **10**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 මාර්තු 19 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

**ගරු මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

**ගරු විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

**ගරු කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

**ගරු ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,** වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

**ගරු කපිල අතුකෝරල මහතා**

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

**ගරු සම්පත් අතුකෝරල මහතා**

**ගරු තිස්ස අත්තනායක මහතා**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

**ගරු වජිර අබේවර්ධන මහතා**

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ධම්මික පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු හේෂා විතානගේ මහතා

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)'නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් 2023 නොවැම්බර් 07 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

III

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රොෂාන් රණසිංහ මහතා විසින් 2023 නොවැම්බර් 16 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

IV

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් 2023 නොවැම්බර් 20 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

V

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිතිඥ වන්දිම වීරක්කොඩි මහතා විසින් 2023 නොවැම්බර් 22 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

VI

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා විසින් 2023 දෙසැම්බර් 10 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

VII

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා විසින් 2024 පෙබරවාරි 08 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXV හා XXVI කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVIII කොටස;

(ii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVI කොටස; සහ

(iii) 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XL සහ XLI කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ XXIII, XXIV හා XXV කොටස්

ඉදිරිපත් කරන ලදී

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 09 දිනැති අංක 2366/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 09 දිනැති අංක 2366/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2023 අංක 34 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2024.01.01 සිට 2024.01.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන

ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් විසින් ප්‍රදානය කරන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 03 දිනැති අංක 2356/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්

ප්‍රදානය කරන ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 17 දිනැති අංක 2358/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිට්යුට් ඔෆ් හයර් එඩියුකේෂන් විසින් ප්‍රදානය කරන දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 21 දිනැති අංක 2359/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන නාවික මෙහෙයුම් පිළිබඳ විද්‍යාවේදී සහ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 28 දිනැති අංක 2360/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 13 දිනැති අංක 2362/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 13 දිනැති අංක 2362/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි යෝජනා කරන ලදී.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වාරිමාර්ග අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7(උ), 10 සහ 77 වගන්ති සහ VI කොටස සමඟ කියවිය යුතු 82 වගන්තිය යටතේ ආයුර්වේද සංග්‍රහය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2024 ජනවාරි 24 දින සාදන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම**: රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) ගල්ගමුව, තඹුත්ත, මයිලෑව යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු 2023.11.19 දිනැති පෙත්සම; සහ

(ii) වාරියපොල, කළුගමුව පාර, දළුපොත, යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. සේනාරත්න මහතාගෙන් ලැබුණු 2023.11.01 දිනැති පෙත්සම

ගරු ඩී. බී. හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අගලවත්ත, පිඹුර, තැන්නපිට පාර, අංක 254 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. විජයකුමාර මහතාගෙන් ලැබුණු 2023.12.19 දිනැති පෙත්සම ගරු අනුප පස්කුවල් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කළුතර දකුණ, යෝන් වීදිය, අංක 22 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඉසෙඩ්.එෆ්. සුහයිරියා මහත්මියගෙන් ලැබුණු 2024.02.07 දිනැති පෙත්සම ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) හබරාදූව, උස්කැටිය වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.ආර්.පී. ලලිතා මහත්මියගෙන් ලැබුණු 2024.02.09 දිනැති පෙත්සම ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කළුබෝවිල, ජයසමගි මාවත, අංක 187/16 එෆ් 3 දරන ස්ථානයෙහි පදිංචි එම්.එස්.එම්. සම්රි මහතාගෙන් ලැබුණු 2023.11.18 දිනැති පෙත්සම ගරු ඉම්රාන් මහරූෆ් මහතා විසින් පිළිගන්වන ලදී.

(6) කෙසෙල් වත්ත, හොරේතුඩුව, මඩකිස්ස පාර, අංක 34, අත්කම් නිවාස දරන ස්ථානයෙහි පදිංචි එම්.එන්. හේමන්ත සල්ගාදු මහතාගෙන් ලැබුණු 2024.01.16 දිනැති පෙත්සම ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**රැස්වීම තාවකාලිකව අත්හිටවීම**

පූ.භා. 11.13

පූ.භා. 11.50 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

පූ.භා. 11.50

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

**6. කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංගත්වය:** ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,—මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ලෙස සම්මත කර ගන්නා බවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැඩි විරෝධතා ඉදිරිපත් කර සිටිය දී එම විරෝධතා නොසලකා හරිමින් එකී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට පටහැනි ලෙස ආණ්ඩු පක්ෂයට එම පනත් කෙටුම්පතේ යම් වගන්තීන් සම්මත කරවා ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

විශේෂයෙන්ම,

(අ) එම පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව එම වගන්තිය විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කරවා ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබිය දී එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ආ) එම පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම වගන්තිය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉවත් කර දමන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් එම වගන්තිය ඒ ආකාරයෙන්ම සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඇ) එම පනත් කෙටුම්පතේ 20, 33(6), 34(1), 35(1) වගන්තීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම්, ශ්‍රේෂ්ඨාධිකරණය සිදු කළ සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම නිර්දේශ කරන ලද සංශෝධන නොකර සරල බහුතරයකින් එම වගන්තීන් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඈ) එම පනත් කෙටුම්පතේ 21 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත් සහ එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉදිරිපත් කරන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් ඒ ආකාරයෙන් කටයුතු නොකර එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඉ) එම පනත් කෙටුම්පතේ 22 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව සංශෝධන සිදු කළ යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඊ) එම පනත් කෙටුම්පතේ 31 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පරිදි සංශෝධන සිදු කළ යුතු බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

මේ බව තහවුරු කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් සම්මත කර ගැනීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව කටයුතු කර නොමැති බවත්, එසේ කටයුතු නොකිරීම නිසා දැනට එම පනත පවතින ආකාරයට එය සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තුවේදී ලැබී ඇත් ද යන්න පිළිබඳව බලවත් ප්‍රශ්නයක් පැන නැඟී ඇති බවත් කථානායකවරයාට එම කොමිෂන් සභාව විසින් යොමුකරන ලද 2024 පෙබරවාරි 08 දිනැති ලිපියේ දක්වා ඇති හෙයින් ද;

එසේම, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියවීමේ දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් පැහැදිලිවම බෙදීමක් ඉල්ලා සිටිය දී එම ඉල්ලීම නොසලකා බෙදීමක් ලබා නොදී එම පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියවීම බෙදීමකින් තොරව සම්මත කර ගැනීමට ඉඩ හැරීමෙන් ද;

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ආකාරයට ඇතැම් වගන්තීන් ආණ්ඩු පක්ෂය විසින් සම්මත කර ගෙන ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ගැඹුරින් සලකා බලන තෙක් එම පනත් කෙටුම්පත නීතියක් බවට පත් කිරීම සඳහා සහතිකය සටහන් නොකරන ලෙසට 2024 පෙබරවාරි 01 දින පැවති පක්ෂ නායකවරුන්ගේ විශේෂ රැස්වීමේදී විපක්ෂයේ මන්ත්‍රීවරයන් පිරිසක් කථානායකවරයාගෙන් ඉල්ලා තිබියදීත් එම ඉල්ලීම සැලකිල්ලට නොගෙන එම පනත් කෙටුම්පත නීතිගත කිරීම සඳහා සහතිකය සටහන් කිරීමෙන් ද;

2024 පෙබරවාරි 26 දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේ දී පොලිස්පති ධූරය සඳහා ජනාධිපතිවරයා විසින් නිර්දේශ කර තිබූ නම සලකා බැලූ අවස්ථාවේ දී එසේ නිර්දේශ කරන ලද පුද්ගලයා එම ධූරයට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් සිව් දෙනෙකු පක්ෂව ද, දෙදෙනෙකු විපක්ෂව ද ඡන්දය දී තිබිය දී සහ සාමාජිකයින් දෙදෙනෙකු ඡන්දය දීමෙන් වැළකී සිටිය දී සහ ඒ අනුව එකී නිර්දේශිත නාමය පොලිස්පති ධූරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව අනුමත කර නොතිබිය දී ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලද 2024 පෙබරවාරි 26 දිනැති ලිපියේ 4 වන ඡේදයේ,

"කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නීතිය ඉදිරියේ ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ)(5) ව්‍යවස්ථාව අනුව උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් සම සමව ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි."

යනුවෙන් සඳහන් කරමින් එසේ ජනාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද පුද්ගලයා නීති විරෝධී ලෙසත්, ව්‍යවස්ථා විරෝධී ලෙසත් පොලිස්පති ධූරයට පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට ව්‍යවස්ථා විරෝධී ලෙසත් නීති විරෝධී ලෙසත් අනුබල දීමෙන් ද, සහාය දැක්වීමෙන් ද, අනුග්‍රහය දැක්වීමෙන් ද;

කථානායකවරයා විසින් පාර්ලිමේන්තු කටයුතුවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බරපතල ලෙස උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති හෙයින් ද;

පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන උත්තරීතර ආයතන පිළිබඳව මහජන විශ්වාසය කඩවන ලෙස කථානායකවරයා කටයුතු කර ඇති හෙයින් ද;

කථානායකවරයා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

කථානායකවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන බව පැහැදිලිවම ප්‍රදර්ශනය කරමින් කථානායක ධුරයේ ස්වාධීනත්වය ද, ගෞරවය ද, බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

අපක්ෂපාතීව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට බැඳී සිටින කථානායකවරයා විසින්ම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කඩකර ඇති හෙයින් ද; සහ

කථානායක ධුරයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පැහැර හැර ඇති හෙයින්;

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

“ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.25 ට ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.12 ට ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය 2024 මාර්තු 20 බදාදා පවත්වනු ලැබේ.

**7. කල් තැබීම**: එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා , අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදි.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 මාර්තු 20 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.